Sinhalese

# විශේෂ ආගමික උපදෙස් - දෙමාපිය කැමත්ත දීමේ පෝරමය (CFMD145)

January 2017

## දෙමාපියන් සඳහා තොරතුරු

*2006 අධ්‍යාපන සහ පුහුණු ප්‍රතිසංස්කරණ පනත* (*Education and Training Reform Act 2006*) මගින් දක්වා ඇති ආකාරයට පාසල් අනාගමික විය යුතුය. මෙම මූලධර්මයට ඇති එකම ව්‍යතිරේකය වන්නේ අනිවාර්ය නොවන විශේෂ ආගමික උපදෙස් (Special Religious Instruction (SRI)) වේ.

මෙම පෝරමයේ 1 වන පිටුව මගින් SRI සම්බන්ධ තොරතුරු දෙමාපියන් හට ලබාදේ. දෙවන පිටුව මගින් සිය දරුවන් SRI හා සම්බන්ධ වෙනවාට කැමතිද නැතිද යන්න දැක්වීමට දෙමාපියන් හට අවස්ථාව ලබාදේ.

ඔබගේ දරුවා SRI හා සම්බන්ධ වෙනවාට ඔබ කැමති නම්, 2 වන පිටුවේ සඳහන් දිනට පෙර මෙම පෝරමය නැවත ලැබෙන්න සලස්වන්න.

සටහන: පාසැල් විෂය මාලාව මගින් සියළුම සිසුන් හට ලබාදෙන සාමාන්‍ය ආගමික අධ්‍යාපනය සමග SRI පටලවා ගත යුතු නැත. සාමාන්‍ය ආගමික අධ්‍යාපනය මගින් සිසුන් හට තමා වටා ඇති ලෝකය හඳුනාගෙන සියළුම සංස්කෘතීන් වෙත ඉවසීමෙන් සහ ගෞරවයෙන් සැලකීමට උපකාර කරන ලොව ඇති විශ්වාසයන් සහ ආගමික විශ්වාස ව්‍යුහය සම්බන්ධ අධ්‍යාපනය ලබාදේ.

## විශේෂ ආගමික උපදෙස් යනු කුමක්ද?

SRI යනු "දේවස්ථාන සහ වෙනත් ආගමික කණ්ඩායම් මගින් ලබාදෙන උපදෙස් වන අතර, පදනම් වන්නේ විශේෂිතවූ ආගමික මූලධර්ම සහ විශ්වාසයන්ය". මේවා අතරට ආගමික ග්‍රන්ථ ආශ්‍රයෙන් කරන ඉගැන්වීම්, සහ යම් විශේෂිත විශ්වාසයක ඇදහීම මත කෙසේ ජීවත්විය යුතුද සහ හැසිරිය යුතුද යන්න ලබාදෙන උපදෙස්ද ඇතුලත්වේ.

SRI යනු 'අවශ්‍ය නම් තෝරාගත හැකි' විෂයමාලා පරිබාහිර ක්‍රියාකාරකමක් වන අතර ඒ මගින් විශේෂිත විශ්වාසයක් සම්බන්ධයෙන් උපදෙස් ලබාදේ. එවා ලබා දෙන්නේ දේවස්ථානයක් හෝ වෙනත් ආගමික කණ්ඩායමක් මගිනි.

SRI හි ඇති විශේෂිත ආගමික ස්වරූපය හේතුවෙන්, අධ්‍යාපන සහ පුහුණු දෙපාර්තමේන්තුව මගින් SRI වැඩසටහන් තුල අන්තර්ගත දේ අනුමත නොකරයි. SRI මගින් ලබාදෙන තොරතුරු දෙමාපියන්ගේ විවරණය සඳහා මාර්ගගතව සහ SRI සපයන්නන් මාර්ගයෙන් දෙමාපියන් හට ලබාගත හැකිය.

## විශේෂ ආගමික උපදෙස් ලබාදෙන්නේ කවුරුන්ද?

SRI උපදෙස් ලබාදෙන්නේ SRI උපදෙස් ලබාදීමට පිළිගැනීමක් ඇති අනුමත කල සපයන්නෙකි මගින්. දැනට උපදේශකයන් පිළිගැනීමට අනුමත කර ඇති සංවිධාන වන්නේ:

| ආගම | සපයන්නා | වැඩිදුර විස්තර සඳහා සපයන්නාගේ වෙබ්අඩවිය | දුරකථන අංකය |
|---|---|---|---|
| ක්‍රිස්තියානි | ACCESS ministries *[ඇක්සෙස් මිනිස්ට්‍රීස්]* | www.accessministries.org.au/ | 1800 063 341 |
| ඉස්ලාම් | Arkan Toledo/Islamic Council of Victoria *[ආර්කන් ටොලීඩෝ/වික්ටෝරියානු ඉස්ලාම් කවුන්සිලය]* | arkan.org.au/ | 1300 857 797 |
| යුදෙව් | United Jewish Education Board *[එක්සත් යුදෙව් අධ්‍යාපන මණ්ඩලය]* | www.ujeb.org.au/ | 03 9523 6844 |
| බෞද්ධ | Religions for Peace Australia (RfP) *[ඕස්ට්‍රේලියානු සාමය සඳහා ආගම්]* | religionsforpeaceaustralia.org.au/ | |
| ඕර්තඩොක්ස් ක්‍රිස්තියානි | | | |
| බහායි විශ්වාසය | | | |
| ෂික් | | | |
| හින්දු | | | |

ස්වේච්ඡා උපදේශකයන් දේවස්ථානයකට හෝ ආගමික සංවිධානයක් හා සම්බන්ධවේ. ඔවුන්ගේ කාර්යභාරය ගුරුවරයෙකුගේ කාර්යභාරය නොවේ. පිළිගැනීම ලබා ගැනීම සඳහා, ඉහතින් දක්වා ඇති එක් සපයන්නෙක් මගින් පුහුණුව ලබා ඔවුන් විසින් රජයේ පාසලක හැසිරිය යුතු ආකාරය දක්වා ඇති හැසිරීම් සංග්‍රහයකට අත්සන් කල යුතුය. ස්වේච්ඡා සේවකයන් පිළිගැනීමේ කොන්දේසියක් වන්නේ ඔවුන් හට ළමුන් සමග කටයුතු කිරීම සඳහාවූ වලංගු පරීක්ෂාවක් (Working With Children Check) ලබා තිබීමයි.

## විශේෂ ආගමික උපදෙස් සඳහා සහභාගිවීම

රජයේ පාසලක සිසුවකු සතියකට උපරිම මිනිත්තු 30ක් දිවා ආහර වේලාවේදී නැතිනම් පාසල ඇරඹීමට හෝ අවසන් වීමට හැකි විගස පැයක් ඇතුලත සහභාගි විය හැකිය.

SRI කිසිම සිසුවෙකුට අනිවාර්ය නොවේ. පාසල් මගින් සිසුන් හට SRI හා සහභාගිවීමට ඉඩ ලබාදිය හැක්කේ මෙම පෝරමය භාවිතා කර දෙමාපියන් විසින් අනුමැතිය ලබා දුනහොත් පමණි.

සිය දරුවන් SRI හා සම්බන්ධවීමට දෙමාපියන් කැමතිනම්, මෙම පෝරමය සම්පූර්ණකර පාසැල වෙත නැවත ලැබෙන්නට සලස්වන ලෙස ඉල්ලා සිටී.

ඔබගේ දරුවාට SRI හා සම්බන්ධවීමට ලබාදෙන කැමැත්ත මෙම පෝරමයේ දක්වා ඇති වැඩසටහන සම්බන්ධයෙන් පමණි. එය සාමාන්‍ය අනුමැතියක් නොවන අතර වලංගු වන්නේ පාසල් වසර අවසාන වන තෙක් පමණි.

**පාසල් විදුහල්පතිවරයා වෙත දැනුම්දීම මගින් ඔබගේ දරුවා SRI වැඩසටහන හා සහභාගිවීම ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්කර ගත හැකිය.**

**වැඩිදුර විස්තර:** Ministerial Direction 145 සහ Department of Education and Training සම්බන්ධ ප්‍රතිපත්ති මෙම වෙබ්අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැකිය http://www.education.vic.gov.au/school/principals/spag/curriculum/Pages/sri.aspx

# විශේෂ ආගමික උපදෙස් - දෙමාපිය කැමැත්ත දීමේ පෝරමය

**පාසැලේ නම:** **පෝරමය නැවත භාරදිය යුතු දිනය:** ……/……/……

| ආගම | පිළිගත් සැපයුම්කරු | උපදේශකයාගේ තොරතුරු | වැඩසටහන පැවැත්වෙන වේලාව සහ කාලය (උදා. 1 සහ 2 වාර සඳහා අඟහරුවාදා පාසැල අවසන්වූ විගස) | SRI වැඩසටහනට සහභාගිවීමට ඇරයුම් කල සිසුන්ගේ වයස් කණ්ඩායම |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

මෙම පෝරමය නිකුත් කරන අවස්ථාවේ එක් එක් ස්වාධීන සේවකයාගේ තොරතුරු (ඔවුන්ගේ නම් සහ පිළිගැනීම කරන සැපයුම්කරු) ලැබී නොමැතිනම්, සිය දරුවා/දරුවන් SRI වැඩසටහනට සහභාගි වන බව දැක්වූ දෙමාපියන් හට අදාල වැඩසටහන ආරම්භ කිරීමට පෙර එම තොරතුරු ලබාදෙනු ඇත. පාසල් විදුහල්පතිවරයා වෙත දැනුම්දීම මගින් දෙමාපියන් හට ඕනෑම අවස්ථාවක සිය දරුවා/දරුවන් මෙම වැඩසටහනෙන් ඉවත් කර ගත හැකිය.

කරුණාකර සලකුණු කරන්න

| | ඔව් | නැත |
|---|---|---|
| 1වන පිටුවේ ඇති SRI සම්බන්ධ තොරතුරු මා විසින් කියවා අවබෝධ කර ගත් බවට මම මෙයින් සනාථ කරමි. | ☐ | |
| ඉහතින් සඳහන් කල SRI වැඩසටහනය ඔබගේ දරුවා/දරුවන් සහභාගිවීම සම්බන්ධයෙන් ඔබ අනුමැතිය ලබා දෙන්නේද? | ☐ | ☐ |

ඔබ ‘ඔව්’ යනුවෙන් සළකුණු කර ඇතිනම්, කරුණාකර ඔබගේ දරුවා/දරුවන්ගේ තොරතුරු ලබා දෙන්න:

| සිසුවාගේ වාසගම | සිසුවාගේ මුල් නම | පංතිය | ඔබගේ දරුවා හට සහභාගි වීමට ඔබ අනුමැතිය ලබා දෙන්නේ කුමන SRI වැඩසටහනටද? |
|---|---|---|---|
| | | | |
| | | | |

මාගේ දරුවා හට SRI හි භාවිතා කිරීම සඳහා උපකරණ ලබා ගැනීමට සේවා සපයන්නා මගින් නියම කරන ගාස්තුවක් (අපේක්ෂිත උපරිම ගාස්තුව: $ ) ඇති අතර, පාසලේ SRI වැඩසටහන පවත්වන්නේද යන්න තීරණය කල පසු මෙම ගාස්තුව ලබා ගන්නා බව **මම අවබෝධ කර ගෙන සිටිමි.**

☐ කරුණාකර සලකුණු කරන්න

**දෙමාපිය/භාරකරුගේ අත්සන:** ……………………………………………………………………………………

**අත්සන:** ……………………………………………………………………………………

**දිනය:** ………./………./…………..